### ගොන් කරපිංචා



**විද්‍යාත්මක නාමය:-***Clauseana indica*

එලය අමු කාලයේ කහ පැහැයටත් ඉදෙන විට දිත්තිමත් ලා රෝස පැහැයකටත් හැරේ. පොකුරක ඵලයන් 10-15 ක් හෝ ඊට වඩා වැඩියෙන් අඩංගු විය හැක. ඵලයක් තුල සුදු පැහැති පොත්තකින් වට වූ ලා කොළ පැහැති වටකුරු බීජයක් අඩංගුය. පොත් ඉවත් කර බීජ වටා අඩංගු කුඩා මාංශල කොටස ආහාරයට ගත හැක. මෙහි මද පැණි රසක් සහ ආවේනික කරපිංචා රසක් ඇත.

### දෙබර හා මසං



**විද්‍යාත්මක නාමය:-** *Ziziphus mauritiana*

අමු ඵල කොළ පැහැයක්ද පැසුණු ඵල කහ පැහැයක්ද ඉදුණු පසු රතු දුඹුරු පැහැයක්ද ගනී. ඵලයක් තුල ලොකු එක් බීජයක් දරයි. ඇඹුල් මිශ්‍ර පැණි රසක් ඇත. හොඳින් පැසුණු හා තරමක් ඉදුණු ඵල ආහාරයට වඩාත් සුදුසුය. හොඳින් ඉදුණු ඵල වල මුඩු රසක් අඩංගු වේ.

### පැණි මාර හෙවත් සාර මාර



**විද්‍යාත්මක නාමය:-***Albizia saman*

ඵලය කරලක් වන අතර අමු කාලයේදී කොළ පැහැයෙනුත් ඉදුණු පසු කළු පැහැයෙනුත් දිස්වේ. කරලක් 10-20 ක් පමණ දිගුය. කරලෙහි බීජ වලට සිවතින් ඇලෙන සුළු පැණි රසැති ද්‍රව්‍යයක් අඩංගු වේ. මෙම පැණි වැනි කොටස ආහාරයට ගැනීම සිදු කරයි. මෙහි පැණි රසක් සමග ආවේනික රසක් අඩංගුය.

### ගල් සියඹලා



**විද්‍යාත්මක නාමය:-***Dialium ovoideum*

ගෙඩියේ පොත්ත විල්ලුද ගතියකින් යුක්තය. ලපටි ගෙඩි වල පොත්ත කොළ -කළු පැහැයක් ගන්නා අතර ඉදුණු පසු දුඹුරු පැහැයක් ගනී. ගෙඩියක් තුල දිගින් 5-9mm පමණ ලා දුඹුරු පැහැති දිලිසෙන ගතියකින් යුත් ඕවලාකාර බීජ එකක් හෝ ඉන් භාග හැඩයක් ගන්නා බීජ එකක් අඩංගුය. පොත්ත ඉවත් කර බීජය වටා ඇති කොටස ආහාරයට ගත හැකිය. අමු කාලයේදී ඇඹුල් රසැති වන අතර ඉදුණු පසු ඇඹුල් හා පැණි රස දෙකම මිශ්‍රය.

### ඩොංගා



**විද්‍යාත්මක නාමය:-***Sandoricum koetjape*

ඵල ගෝලාකාරය. මැංගුස්ගෙඩියකට වඩා මදක් කුඩාය. ඉදුණු පසු කහ පැහැතිය.සුදු පැහැති බිකි වලට වෙන් වූ මාංශල කොටස් ආහාරයට ගත හැක. ඇඹුල් මිශ්‍ර පැණි රසක් ඇත.

### අට්ටික්කා



**විද්‍යාත්මක නාමය:-***Ficus racemosa*

ඵල කඳෙහි ඇති අමු ගෙඩි කොළ පැහැතිය ඉදෙන විට රතු පැහැයට හැරේ. ඉදුණු ගෙඩි වල මැද ඇති බීජ ඉවත් කර ආහාරයට ගත හැක. මෙයට ආවේනික සුවඳක් සමග මද පැණි රසක් ඇත.

# මොනරාගල වැවෙන වන පලතුරු රස විදිමු 02







තාක්ෂණික උපදේශකත්වය
ආර්.එම්.එන්.ටී.අමරසිංහ
ස්ථානභාර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, මදුරුකැටිය.

සැකසුම
එල්.ජයසිංහ
පර්යේෂණ සහකාර

පරිගණක සැකසුම
කේ.එම්.එන්.සඳමාලි
එම්.වී.ප්‍රියංගා කුමාරි මහාවිතාරණ
ඉෂාර කුලරත්න

Phone: +94552276270
Fax: +942276270
E-mail: arsmadurukatiya@gmail.com

## හීන් වේවැල්



**විද්‍යාත්මක නාමය:-** *Calamus delicatulus*

ඵලය පළතුරක් ලෙස ආහාරයට ගනී. ඵලයේ පොත්ත අමු කාලයේ කොළ පැහැතිය පැසෙන විට ලා කහ පැහැයටත් ඉදුණු විට සුදු පැහැයටත් හැරේ.අමු කාලයේ ඇඹුල් රස වන අතර ඉදුණු පසු ඇඹුල් මිශ්‍ර පැණි රසක් ඇත. ලපටි ගෙඩි පොත්ත ඉවත් කර ඇටය සමග ආහාරයට ගනී.ඉදුණු ගෙඩි වල පොත්ත ඉවත් කර ඇටය වටා ඇති මාංශලය ආහාරයට ගනී.

## එරමිණියා



**විද්‍යාත්මක නාමය:-** *Ziziphus oenoplia*

අමු කාලයේදී කොළ පැහැති ඉදෙන විට ක්‍රමයෙන් කහ , දුඹුරු පැහැ වී අවසානයේ කළු පැහැයට පත් වේ. ගෙඩියක් තුල දුඹුරු පැහැති එක් බීජයක් පවතී. ඵලය පලතුරක් ලෙස යොදා ගනී. අමු ගෙඩි හා ඉදුණු ගෙඩි දෙවර්ගයම භාවිතා කළ හැක.අමු ගෙඩි ඇඹුල් රසයකින් යුක්ත වුවද ඉදුණු පසු ඇඹුල් රසට අමතරව ආවේනික මිදි පැණි රසක්ද අඩංගුය.

## අං කෙන්ද



**විද්‍යාත්මක නාමය:-**

*Acronychia pedunculata*

ඉදුණු අං කෙන්ද ගෙඩි වල ලෙල්ල කොටස ආහාරයට ගනී. ආවේනික රසක් සමග මිදි පැණි රසක් ඇත. අමු ගෙඩි සැර

## කොබ්බෑ



**විද්‍යාත්මක නාමය:-** *Allophylus cobbe*

අමු කාලයේ කොළ පැහැති වන අතර ඉදුණු පසු තැඹිලි/ රතු වර්ණයක් ගනී.ගෙඩියක් තුල ගෝලාකාර එක් බීජයක් ඇත. කහට රසට හුරු මිදි පැණි රසක් ඇත. හොඳින් ඉදුණු ඵල වල බීජය වටා ඇති මාංශල කොටස ආහාරයට ගනී.

## දමුණු

**විද්‍යාත්මක නාමය:** *Grewia daminne*



ඵල ගෝලාකාර තනි ගෙඩි ලෙස හෝ දෙබිඩි ගෙඩි ලෙස හට ගනී. අමු ගෙඩි ලා කොළ පැහැයක් හෝ රෝස පැහැයක් ගන්නා අතර ඉදුණු පසු දිස්නිමත් රෝස හෝ රතු දම් පැහැතිය. ඉදුණු ගෙඩි වල රතු පැහැති කුඩා ලප දැකිය හැකිය. අමු ඵල ඇඹුල් රසැතිය. ඉදුණු ඵල ඇඹුල් හා පැණි රසක් සමග මිහිරි ඊටම ආවේනික රසක් ඇත.

## කොහුකිරිල්ල



**විද්‍යාත්මක නාමය:-** *Microcos paniculata*

වැස්සෙන දිය බිංදුවක හැඩය ගනී. අමු ගෙඩි කොළ හෝ කොළ මිශ්‍ර දම්පැහැ වන අතර ඉදුණු පසු කළු පැහැතිය. ඇඹුල් මිශ්‍ර මිහිරි රසක් අඩංගුය, කෙඳි බහුලය, අමු ගෙඩි වල කොසු සුදු පැහැති වන අතර ඉදුණු ගෙඩි වල කොසු දුඹුරු පැහැතිය.

## වල් කැලිය



**විද්‍යාත්මක නාමය:-** *Grewia orientalis*

අමු ඵල කොළ පැහැති වන අතර පැසුණු විට කහ පැහැයටත් ඉදෙන විට තැඹිලි - දුඹුරු පැහැයටත් හැරේ. කලාතුරකින් කණ්ඩිකා ² ක් හෝ තනි බීජ ඵලයන්ද දැකිය හැකිය. බොහෝමයක් ඵලයන් තුල බීජ 4 ක් අඩංගුය. අමු ගෙඩි සෙවල ගතියකින් යුක්තය. ඉදුණු පසු පැණි රසැතිය. කෙඳි බහුලව අන්තර්ගතය. අමු හා ඉදුණු ගෙඩි ආහාරයට ගත හැකිය.

## වල් ඉඳි



**විද්‍යාත්මක නාමය:-** *Phoenix pusilla*

මෝරණ විට රතු පැහැති වේ. හොඳින්ම මේරූ පසු අඳුරු රතු පැහැයක් ගන්නා අතර ඉදුණු පසු කළු පැහැතිය. ගෙඩිය ඕවලාකාර හැඩතිය. ගෙඩිය තුල රට ඉඳි බීජ හැඩති ප්‍රමාණයෙන් කුඩා බීජයක් ඇත. බීජය වටා ඇති පොත්ත කොටස ආහාරයට ගනී. අමුවෙන් කහට රසක්ද ඉදුණු පසු කහට මිශ්‍ර පැණි රසක්ද ඇත. හොඳින්ම ඉදුණු පසු ප්‍රනීත පැණි රසකින් යුක්තය. ළපටි ඉඳි ගෙඩි වල පොත්ත ඉවත් කර ඇටය ආහාරයට ගනී. ඒවා බත් ඉඳි ලෙස හඳුන්වයි.

## නලල් බටු/මොංචු

**විද්‍යාත්මක නාමය:-** *Physalis minima*



කුඩා මළු ආකාරයට විකරණය වූ මනි පත්‍රයක් තුළ ඵල හට ගනී. තිබ්බටු ගෙඩියක් ප්‍රමාණයට හෝ ඊට තරමක් විශාල වේ. ඵලය තුල බීජ විශාල ප්‍රමාණයක් අඩංගුය. ඉදුණු ගෙඩි ආහාරයට ගත හැක. තක්කාලි රසට සමාන රසක් දරයි.